සියලු ම හිමිකම් ඇවිරිණි |
முழுப் பதிப்புரிமையுடையது |
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2014
இரண்டாம் தவணை மதிப்பீடு - 2014
**Second Term Evaluation - 2014**

| | | |
|---|---|---|
| 9 ශ්‍රේණිය<br>தரம் 9<br>Grade 9 | භූගෝල විද්‍යාව I හා IIපත්‍රය<br>புவியியல் வினாத்தாள்-11<br>Geography Paper I & II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |

## II - පත්‍රය

*උපදෙස්:*
- **පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවීම අනිවාර්යයි.**
- **තවත් ප්‍රශ්න හතරකට ද පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5 කි.**

(01) දෙවන වාරයේ දී පාසල් පදනම් කරගත් වැඩ පිළිවෙල යටතේ පන්ති කාමරයේ දී ඔබ කළ ක්‍රියාකාරකමේ නම් ලියන්න. (ලකුණු:03)

(i) දෙවන වාරයේ දී පාසල් පදනම් කරගත් වැඩ පිළිවෙල යටතේ පන්ති කාමරයේ දී ඔබ කළ ක්‍රියාකාරකමේ නම ලියන්න. (ලකුණු:01)

(ii) එම ක්‍රියාකාරකමට පෙළ පොතෙන් ඔබ යොදාගත් මාතෘකාව ලියන්න. (ලකුණු:01)

(iii) ඔබේ ගුරුතුමා/ගුරුතුමිය එම ක්‍රියාකාරකම ඉටු කිරීමට පෙර ඔබට දුන් උපදෙස් 3 ක් ලියන්න. (ලකුණු:03)

(iv) මෙම ක්‍රියාකාරකමේ දී ඔබට උදව් කළ පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු:02)

(v) ඔබ විසින් නිම කළ ක්‍රියාකාරකමට තොරතුරු ලබාගත් ක්‍රම 3 ක් ලියන්න. (ලකුණු:03)

(vi) මෙම කාර්ය ඉටු කිරීමේ දී ඔබ මුහුණ පෑ ගැටළු දෙකක් ලියන්න. (ලකුණු:03)

(vii) එම ගැටළු විසඳා ගැනීමට ඔබ යෙදූ උපක්‍රම 2 ක් ලියන්න. (ලකුණු:02)

(viii) ඔබ විසින් නිම කළ ක්‍රියාකාරකමෙන් ඔබේ ජීවිතයට ලබාගත් අත්දැකීම් දෙකක් ලියන්න. (ලකුණු:02)

(මුළු ලකුණු:16 කි)

(02) (i) නිල් ග්‍රහයාගේ වායුගෝලය තුළ ජීවීන්ගේ පැවැත්මට ශාක වර්ධනයට අත්‍යවශ්‍ය වායු වර්ග දෙක නම් කරන්න. (ලකුණු:02)

(ii) මිනිසාට ජලයෙන් ඇති ප්‍රයෝජන 04 ක් ලියන්න. (ලකුණු:04)

(iii) වර්තමාන ලෝකයට ඇති ප්‍රබල ගැටලුවකි. ජල දූෂණය, මෙය වළක්වා ගත හැකි ක්‍රම දෙකක් ලියා ඒවා විස්තර කරන්න. (ලකුණු:05)

(03) (i) ලොව මානුෂ ශිෂ්ටාචාර 3 ක් ආසියාවේ පිහිටා තිබුණි. ඉන් දෙකක් නම් කරන්න. (ලකුණු:02)

(ii) ආසියානු ප්‍රදේශයේ සාපේක්ෂ පිහිටීම ගත් විට උතුරින්, දකුණින්, නැගෙනහිරින් පිහිටි සාගරවල නම් ද බටහිරින් පිහිටි මහද්වීපයේ නම ද ලියන්න. (ලකුණු:04)

(iii) ආසියා මහද්වීපයේ ආර්ථිකය වී වගාව මත පදනම් වී ඇත. මීට බලපෑ හේතු 2 ක් දක්වන්න. ඒවා විස්තර කරන්න. (ලකුණු:05)

(i) මොංගොලොයිඩ් මානව වර්ගය ජීවත් වන රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු:05)

(ii) ලෝක උරුම් යටතේ ස්පර්ශ උරුම් 2 ක් ද, අස්පර්ශ උරුම් 2 ක් ද ලියන්න. (ලකුණු:04)

(iii) ලංකාවේ ලෝක උරුමයක් නම් කර, ඒ ගැන වාක්‍ය 05 ක් ලියන්න. (ලකුණු:05)

(i) ආසියාවේ දක්නට ලැබෙන කෘෂිකර්මයේ ප්‍රධාන අංග දෙක කුමක් ද? (ලකුණු:02)

(ii) 1980 දශකයේ දී ආසියාකරයේ සීඝ්‍ර කාර්මික දියුණුවකට පත්වූ නව කාර්මික රටවල් 04 ක් නම් කරන්න. (ලකුණු:04)

(iii) කලාපීය සංවිධානයක් ලෙස ලෝකයේ ප්‍රසිද්ධ සාක් සංවිධානයේ අරමුණු 05 ක් ලියන්න.

(i) උෟව පුරවර සංවර්ධන වැඩසටහන යටතේ දියුණු කිරීමට තෝරාගත් දිස්ත්‍රික්ක 2 ක් නම් කරන්න. (ලකුණු:02)

(ii) කොළඹ පුරවර ප්‍රදේශයේ වර්තමානයේ මුහුණ දී ඇති ගැටළු 4 ක් ලියන්න. (ලකුණු:04)

(iii) "ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක දැවැන්තම බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය වන්නේ මහවැලි සංවර්ධන ව්‍යාපෘතියයි." එයින් අපේක්ෂිත කාර්යයන් දෙකක් දක්වා විස්තර කරන්න. (ලකුණු:05)

(i) A හා B පින්තූර දෙක නම් කරන්න.
(ලකුණු:02)

A



B



(ii) උතුරු ප්‍රදේශයට ආවේණික ලක්ෂණ 04 ක් සඳහන් කරන්න. (ලකුණු:04)

(iii) සංචාරක ව්‍යාපාරයෙන් ලංකාවට ලැබෙන වාසි 02 ක් දක්වා විස්තර කරන්න. (ලකුණු:05)